යටියන්තොට ප්‍රාදේශීය සභාව සභා වාර්තාව - **2023.03.14**

**ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව දිනය - 2023.03.14 වේලාව - පෙ.ව.9.00**

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා 2.ගරු උප සභාපති - ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3. ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා
4. කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 ජී.ම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා
6. ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7. ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
8. ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9. කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා
10 .එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11. ඒ.ජී.තිලකරත්න මැතිතුමා
12.ඩී.ඒ.සුනිල් දෙයියාගල මැතිතුමා
13.එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
14.එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා
15.ඩී.පි.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
16.ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා
17.ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
18.එස්.සුදර්ශන් මැතිතුමා
19.එච්.ඒ.දිල්සානි ප්‍රශාදිකා මැතිනිය
20.කේ.මධුෂිකා ප්‍රශාදිනි මැතිනිය.
21.එම්.ඩී.ඥානවති මැතිනිය
22.ටී.ඉමල්කා සංජීවනි මැතිනිය
23.බී.සීතා රංජනි මැතිනිය
24.ඒ.පී.ඩබ්ලිව්.එම්.ඩයනා උදයංගනි මැතිනිය
25.කේ.කමල්රාජ් මැතිතුමා

**සහභාගි වූ නිලධාරින්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා 2.සංවර්ධන නිලධාරි ආර්.එච්.සී.නිශාන්ති සෙනවිරත්න මිය

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහි කිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් පාලන ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සභිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්‍රීතුමන්ලා හට , කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වි සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා. අද දින සභාව බාධාවකින් තොරව පවත්වාගන යාමට සහයෝගය අපේක්ෂා කරනවා.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

2023.02.14 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරිම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරිම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2014.02.14 වන දින සභා වාර්තාවේ පිටු අංක 3 හි සභා තීරණ අංක (ඉ) 3 සහ (ඉ) 4 යෝජනාවට අනුව මාගේ අදහස් දැක්වීම හා ගරු සභාපතිතුමාගේ නිවේදනය ඇතුළත් නොවීම එකී සඳහන " එම බැංකු ගිණුම් වල පළමු හා දෙවන අත්සන් කරුවන් ලෙස දැනට සභාවේ බැංකු ගිණුමේ පළමු සහ දෙවන අත්සන්කරුවන්ම යොදා ගන්නා ලෙස ඇතුළත් විය යුතුයි. "

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ඉහත ඉදිරිපත් කළ සංශෝධිත කරුණු සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසා සිටී අතර සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2023.02.14 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරිම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
2023.02.14 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**
*යටියන්තොට නාගරික සංවර්ධන බල ප්‍රදේශයේ සීමා මායිම් පුළුල් කිරිම අංක 2306/10 (අතිවිශේෂ) හා 2022.11.14 දිනැති ගැසට් පත්‍රය මගින් සිදු කර ඇති බව නිවේදනය කරමි.

* සබරගමු පළාත් සභාවේ ප්‍රතිපාදන මත ඉදි කර යටියන්තොට ප්‍රාදේශීය සභාවට භාර දී ඇති ජංගම වෙළඳ කුටි 14 ව්‍යාපාරිකයින් සඳහා ලබා දීමට 2022.01.11 දින මහ සභාව විසින් තීරණය කළද ඉන් 04 දෙනෙකු ගිවිසුම්ගත වීමට නොපැමිණි නිසා එම කඩ කාමර 4 නැවත ටෙණ්ඩර් කර සුදුසු අයවලුන් තෝරා ගැනීමට කටයුතු කර ඇති බව නිවේදනය කරමි.

* සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අංක ACK/16/1/2-11 දරණ හා 2023.03.13 දිනැති ලිපිය මගින් 2022 අභ්‍යන්තර විගණන වාර්තාවේ නිරීක්ෂණය වූ කරුණු පිළිබඳව දැන ගැනිම සඳහා නිවේදනය කරමි.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම**
**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**
**(ඉ) කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 01. අප සභාවේ සේවයේ නියුතු පහත සඳහන් මහත්ම මහත්මින් විසින් ආපදා ණය මුදලක් ඉල්ලුම් කර ඇත. එම මුදල සභා අරමුදලින් ගෙවීම් කිරිම සඳහා මා යෝජනා කරනවා.

1 .ආර්.කේ.ඩී.එස්.කුමාරි මිය - රු.69186.00
2. තුෂාරා නිල්මි මිය - රු.70000.00
3. ශානිකා රොෂානි මෙය - රු.132370.00
4 .ආර්.එම්.අයි.රාමනායක මිය - රු.63213.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 02. 2023 වර්ෂයේ ප්‍රාදේශිය සභා අරමුදල් යොදවා ඉටු කිරිමට යෝජනා කරන ලද පහත ව්‍යාපෘති වලට අදාළ ඇස්තමේන්තු සඳහා අනුමැතියක් ,අනුමත සමිතියක් මඟින් ඉටු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01.ගොමාඩුව දික්හේන මාර්ගයේ ගම්මැද්ද අතුරු පාර සංවර්ධනය කිරීම. - රු.250,000.00
02.ගොමාඩුව ගාලෝවිට මාර්ගය සංවර්ධනය කිරීම. - රු.200,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 03. ගෝණගමුව මිණිගම්මන මාර්ගය පාසල අසල පැති බැම්ම ඉදි කිරීම සඳහා සභාව විසින් අනුමත කර ඇති ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට තව දුරටත් අවශ්‍ය වන ප්‍රතිපාදන රු.500,000.00 ක් 2023 අයවැය 309(7) වැය ශීර්ෂයෙන් වෙන් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.මෙම කර්මාන්තයේ ගිවිසුම අවසන් කර දැනට වැඩ අවසන් කර ඇති බිල සකස් කර තබා ගැනීම සුදුසු යැයි මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් මෙම කර්මාන්තයේ ගිවිසුම අවසන් කර දැනට ඉදිරිපත් කර ඇති බිල සකස් කර තබා ගැනීම හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථාවකදි දැනට ණය හිමි ලෙස වෙන් කර ඇති , ඒසේම 2023.04.30 දිනට ණය හිමි නිරවුල් නොවන මාර්ග සංවර්ධන යෝජනා අතරින් පැරණිම ණය හිමි වෙන් කිරිම් වලින් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ණය හිමි ශීර්ෂයෙන් භාවිතා කිරිම සඳහාද සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් මෙම කර්මාන්තයේ ගිවිසුම අවසන් කර දැනට ඉදිරිපත් කර ඇති බිල සකස් කර තබා ගැනීම හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථාවකදි දැනට ණය හිමි ලෙස වෙන් කර ඇති , ඒසේම 2023.04.30 දිනට ණය හිමි නිරවුල් නොවන මාර්ග සංවර්ධන යෝජනා අතරින් පැරණිම ණය හිමි වෙන් කිරිම් වලින් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ණය හිමි ශීර්ෂයෙන් භාවිතා කිරිම සඳහාද ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 04. පොදු වෙළඳපල මහජන බැංකු වැසිකිලියට අදාළව ගලිවල කඩා වැටී ක්‍රියා නොකරන තත්වයට පත්ව ඇත.ඒ නිසා එම ස්ථානය අනාරක්ෂිත හා සෞඛ්‍යාරක්ෂිත නොවන තත්වයක් ඇතිව තිබේ.මේ නිසා එම ස්ථානය සහ ආසන්නයේ ප්‍රජාව දැඩි අපහසුතාවයකට පත්ව ඇත.මෙම ස්ථානය කඩිනමින් පිළිසකර කල යුතු බවට මහ සභාවේද අවධානයට ලක්වී තිබේ.එම ස්ථානයට අලුතින් ගලි ටැංකි යොදා බට පද්ධතිය අලුත්වැඩියා කර නැවත අන්තර බැඳුම් ගල් තැබීම කල යුතුව ඇත.එම නිසා එම ස්ථානයට ගලි ටැංකි තුනක් යොදා ඊට අවශ්‍ය අමතර ද්‍රව්‍ය සපයා ගෙන අවශ්‍ය පිරිස් බලය ඍජු ශ්‍රමය යටතේ සපයා ගෙන අවශ්‍ය යන්ත්‍ර දිස්ත්‍රික් මිල ක්‍රමය යටතේ සපයා ගෙන,කාර්යය ඉටු කිරීමටත් ඒ සඳහා වන වියදම් සභා අරමුදලෙන් දැරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**

ගරු සභාපතිතුමනි, යටියන්තොට වෙළඳ සංකීර්ණයේ කණු ටික පිළිසකර කර තීන්ත ආලේප කළොත් හොඳයි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 05. යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම්,ඉඩම් අනු බෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම අනුමත කිරීම පිළිබඳ මෙම ආයතනය හා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව සුදුසු සංශෝධනවලට යටත්ව යටියන්තොට බල ප්‍රදේශයේ අදාල ප්‍රදේශවලට වලට බලාත්මක කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 06. යටියන්තොට ප්‍රාදේශීය සභාව තුළ දන්ත සායනයක් පැවැත්වීම අවශ්‍ය පහසුකම් ආරම්භ කිරීමට සහ ඒ සඳහා වන අවශ්‍ය කටයුතු ප්‍රාදේශීය සභාව වෙතින් සලසා දීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.මේක හොඳ වැඩසටහනක්,සභා කාර්යාලයේ පහත මාලයේ ගත්තොත් හොඳයි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 06)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 07. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතුව ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුලත් දේපල ස්ථාන සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් වටිනාකම් තක්සේරුවක් අයදුම්කර ඒ වෙනුවෙන් දේපල ස්ථාන 15 සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අංක CV/PCA/YPS/KE/01,02,05,07,08,10,11,18,19,20 දරන 2023.02.27 දිනැති තක්සේරු වාර්තාව අනුව එම දේපල වල තක්සේරු වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනවල හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.පී.දිල්සානි ප්‍රසාදිකා මැතිනිය**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 07)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 08. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩුව පවතින සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා දෙදෙනෙකු සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය බව එම තනතුරට අදාලව දෛනිකව රැස්වන වැඩ සැළකිල්ලට ගැනීමේ දී හඳුනාගෙන ඇත.ඒ සඳහා අංක 212,ගොමාඩුව යටියන්තොට පදිංචි ඒ.එච්.නිශාන් සමිත් රත්නසිරි යන අය ( ජා.හැ.932522071V) හා අංක 55 මහවිල,නවගම්මානය,යටියන්තොට පදිංචි මාලින්ද සමන්සිරි දසනායක යන අය ( ජා.හා.883343000V) සුදුසු බව හා එම අය එම තනතුරේ රාජකාරි සඳහා කැමති බව දන්වා ඇති බැවින් වර්ෂයක කාලයක් සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ගැනීමටත්,රාජ්‍ය පරිපාලන චක්‍රලේක 3/2016 යටතේ වන දෛනිකව දීමනාව ගෙවීම් කිරීමටත් ,නොදිරන කසල විධිමත් කිරීම සඳහා රාජකාරි පැවරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම් නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඩී.ප්‍රසාදිකා ජයසිංහ මැතිනිය**
ගරු සභාපතිතුමනි, බැකෝ යන්ත්‍ර රියදුරෙක් ගන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, බැකෝ යන්ත්‍රය සම්බන්ධයෙන් අවධානය යොමු කර නියමිත රියදුරෙක් යොදලා ලේකම්තුමා යටතේ නිසියාකාරව භාර දෙන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත (ඉ) 08 යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම (ඉ) 08 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 09. අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් රුවන්වැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ නඩු අංක 83679 (ඩබ්.ඒ සරත් ගුණතිලක මයා,අංක 108 ,ගිනිගත්හේන පාර ,යටියන්තොට) තීන්දුවට එරෙහිව කොළඹ අභියාචනාධිකරණය ඉදිරියේ ගොනුකර තිබූ අභියාචනා පෙත්සම සඳහා සරත් ගුණතිලක මහතා 2023.02.15 දින නඩුවට ඉදිරිපත්වී කරුණු ඉදිරිපත් කර සමථයට පත්වූ බවත් එම නිසා, එදින ගරු අධිකරණය වෙතින් අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට අවසර දෙන ලද බවත්, එහෙයින් නඩු වාර්තාව ඉදිරිපත් කරන තෙක් නඩු කටයුත්තට අදාලව ඉදිරි කටයුතු සඳහා සභාවේ අදහස් හා සුදුසු තීරණයක් ලබා දෙන ලෙසත් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.නඩු වාර්තාව ලැබුණාම තීරණයක් ගනිමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් වෙනත් අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම නඩු වාර්තාව ලැබුණු පසු තීරණයක් ගැනීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 10. යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වින්සන්ට් පෙරේරා මහජන ක්‍රීඩාංගනයේ එක් කාර්යයක් සඳහා දින 03 කට වඩා වැඩි කාලයක් කුලියට ලබා දීමේ දී දෙපාර්ශවය අතර කටයුතු විධිමත් කර ගැනීම හා අලාභ ප්‍රතිපූර්ණය විධිමත් කර ගැනීම සඳහා කුලී ගැනුම්කරුවන් සමඟ එළඹීමට යෝජිත සකස් කර ඇති ගිවිසුම් පත්‍රයට ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ක්‍රීඩා පිටිය වෙන්කරන්න මුදල් ලබා දෙන අයට ප්‍රමුඛතාවය දෙන්න.ව්‍යාපාරික වශයෙන් ක්‍රීඩා වලින් මුදල් ලබා ගන්නවානම් මුදල වැඩිකරලා ගන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත (ඉ) 10 යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 10 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 11. යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනනය වන සායනික අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම තුළින් මහජනතාවට මතු වන සෞඛ්‍ය ගැටළු මෙන්ම පාරිසරික ගැටළු අවම කර ගැනීම සඳහා රසායනාගාර හා වෛද්‍ය මධ්‍යස්ථාන සමග ඇති කර ගැනිමට අපේක්ෂිත ගිවිසුම මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 12. මෙම ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂයේ සිට සකස් කරන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල සේවක ණය අයවිය යුතු ශේෂය සහ සේවක ණය ගිණුමේ අයවිය යුතු ශේෂය අතර රු.672,408.87ක නොගැළපීමක් පවතී. මෙම නොගැළපීම කුමන වර්ෂයේ සිට ජනනය වී ඇත්දැයි නිශ්චිතව හදුනාගැනීමට නොහැකි වේ. ඊට හේතුව වන්නේ 2002 වර්ෂයෙන් පසු 2017 වර්ෂය දක්වා අයවිය යුතු සේවක ණය ශේෂය තහවුරු කිරීමට වාර්ෂික උපලේඛනයක් සකස්කර ඉදිරිපත් නොවීමයි. 2017 වර්ෂයෙන් පසු උපලේඛනයක් සකස් වුවද හදුනාගත් ඉහත නොගැළපීම නිරවුල් කරගැනීමට නොහැකි වී තිබිණ. මෙම නොගැළපීම නිරවුල් කිරීම සදහා දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු මඟපෙන්වීම් අනුව අදාළ ලේඛන අධ්‍යනය කරන ලදී. නමුත් මෙම ලේඛනවල පවතින අපහැදිලිතා, දුර්වර්ණ වීම්, තුලනය නොවීම් හා ඒ ඒ ලේඛන අතර සුදුසු යොමු සටහන් නොවීම නිසා නිරවුල් කිරීමට අදාළ තොරතුරු හදුනාගැනීම අපහසු කාර්යයකි. 2002 සිට 2017 දක්වාම සේවක ණය උපලේඛන සකස් නොවීමට හා උපලේඛන නොගැළපීම නිරවුල් කරගැනීමට දීර්ඝ කාලයක සිට නොහැකි වීමට මෙම අපැහැදිලිතා හේතුවී ඇති බව හදුනාගැනීමට හැකි විය. නමුත් 2011 වර්ෂය හා 2014 සිට 2017 වර්ෂය දක්වා ලේඛන සහ එම වර්ෂවල මූල්‍ය ප්‍රකාශන එකිනෙක ගැළපීමේදී රු. 611,520.85ක සේවක ණය අයවීම් වටිනාකමක් තැන්පත් හා අත්තිකාරම් ලෙස ගිණුම් තැබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දෝෂයක් හදුනාගැනීමට හැකි විය.

නමුත් 2002 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අදාළ ලේඛනවල පවතින ගැටලු සහගත තත්ත්වයන් හා විශේෂයෙන්ම 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා පවතින හදුනාගත නොහැකි අපැහැදිලි ලේඛන හා ගොනු තොරතුරු නිසා තවදුරටත් පවතින රු. 60,888.02ක වටිනාකම හදුනාගෙන, නිරවුල් කිරීමට නොහැකි වී ඇත. නමුත් ඉහත නිරවුල් කිරීමට අදාළ හදුනාගැනීම් හා සමානව, මෙම රු.60,888.02 වටිනාකම ද ගිණුම් තැබීමේ දෝෂ නිසා ඇතිවූ නොගැළපීම් බවට උපකල්පනය කළ හැක. විශේෂයෙන්ම 2018 වර්ෂයේ සිට සේවක ණය වාර්ෂික ගැළපීම් සියල්ල, සේවක ණය ගිණුම හා වාර්ෂික ගිණුම් ප්‍රකාශ සමග එකිනෙක ගැළපෙන පරිදි යාවත්කාලීනව නඩත්තු වේ. තවදුරටත් නිරවුල් කරගැනීමට නොහැකි මෙම රු. 60,888.02ක් වටිනාකම ලේඛන තුළ හදුනාගැනීම් මත නිරවුල් කිරීමට වෙහෙසවීම නිෂ්ප්‍රයෝජන හා අකාර්යක්ෂම ආයතනික යෙදවීමක් විය හැකි බව දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටුවේ ද මගපෙන්වීම වේ.

ඒ අනුව නිශ්චිතව හදුනාගෙන ඇති රු. 611,520.85ක දෝෂ සහිත ගිණුම් තැබීම ගිණුම් ප්‍රකාශන තුළ සභා අනුමැතියෙන් නිවැරදි කිරීමටත්, තවදුරටත් ශේෂවන, ලැබිය යුතු වටිනාකමක් ලෙස ගිණුම්ගතව ඇති රු. 60,888.02ක නොගැළපීම් වටිනාකම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය අනුව ගරු අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව අත්හැරීම සඳහාත් ගරු මහා සභා අනුමැතිය ලබාගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අපට මේ පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍යයි.එම නිසා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට සුදුසුයැයි මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

*ගරු මහ සභාව පෙ.ව 11.30 කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිසාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

*කාරක සභාව පෙ.ව 11.45 පමණ මහ සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත (ඉ) 12 යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 12 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 12)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 13. මත්තමගොඩ හතමුණෝවත්ත ඉඩමේ සීමා මායිම් වෙන් කර කම්බි වැට සකස් කිරිමට යටියන්තොට ඒ.බී.සී කොන්ක්‍රීට් ආයතනයෙන් මිලදී ගත් රු 27,000.00 ක් වටිනා කොන්ක්‍රීට් කණු 30 සඳහා ගෙවීම් කිරිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 13)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 14. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු බලවත්තොට ඕවිටේවත්ත ඉඩම බදු දීමේ ගිවිසුම හා සතිපොළ ගබඩා කාමරය බදු දිමේ ගිවිසුම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**හදිසි යෝජනා** **(සභා තීරණ අංක 14)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 15. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් ඉටු කරන ලද කර්මාන්තවල බිල්පත් වටිනාකම ගෙවීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.
**1.** ගොමාඩුව රාජපක්ෂ මහතාගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරිම - රු. 300,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු සභාපතිතුමනි,මෙම යෝජනාවේ වචන පැටලීමක් වෙලා තියෙනවා.අවශ්‍ය වන්නේ ඉදිරිපත්වෙලා තියෙන රු 300000.00 ක ඇස්තමේන්තුවක් අනුමත කර ගැනීමත්,එය 2022 ප්‍රාදේශීය සභා අරමුදලින් ණය හිමි ඉටු නොකළ කර්මාන්ත වලින් බිල්පත් වටිනාකම ගෙවීමට අනුමැතිය ලබා ගැනිමට ලෙස විය යුතුය.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව හා ඊට එකතු වූ සංශෝධන සැළකීමේ දී 2022 වර්ෂයේ මෙවන් කර්මාන්තයක් ඉටු කර නොමැති බව පැහැදිලියි.එම නිසා ඉදිරිපත් කළ සංශෝධනය අනුව යෝජනාව නිවරදි විය යුතුය.ඒ අනුව ඊට සභාවේ විරෝධයක් සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් ඉහත සංශෝධිත කරුණු ඇතුළත්ව (ඉ) 15 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 15)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 16. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රයෝජනය සඳහා සීමාසහිත කෑගල්ල විවිධ සේවා සමූපකාර සමිතිය වෙතින් ලදුපත් (ප්‍රා.ස.01) මුද්‍රණය කිරිම වෙනුවෙන් රු.135,725.00 ක මුදල සභා අරමුදලින් ගෙවීම් කිරිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති ඒ.වි රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 16)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 17. ආදේශක කම්කරුවෙකු ලෙස සේවය කරන වී.ජී.හීන්මැණිකේ මිය 2023.03.02 දින සිට 2024.03.02 දක්වා සේවා ගිවිසුම් මත වැඩ ක්ෂේත්‍ර කම්කරුවෙක් ලෙස බඳවා ගැනිමට ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පි ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 17)**

**(ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**
**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**

01 2023 පෙබරවාරි මාසයට අදාල වියදම් වාර්තාව
02. 2023 පෙබරවාරි මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව
03. 2023 පෙබරවාරි මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව
04. 2023 පෙබරවාරි මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව

(ඌ) වෙනත් කරුණු
**01.**නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිම
**02.**ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ කාල සීමාව තුළ උප සභාපති ලෙස කටයුතු කිරිමට මට අවස්ථාව දුන්නා. මාගේ ජනතාවට මා ස්තුතිවන්ත වෙනවා.සභාවේ ගරු සභාපතිතුමා මෙන්ම ගරු මන්ත්‍රීතුමන්ලා සමඟ මතවාද ගැටුම් සියල්ලම එක්ක අපි සුහදව කටයුතු කළා. පසු ගිය කාලයක ගරු මන්ත්‍රීමන්ලා අතරත් නිලධාරින් අතර සබැදියාව දුර්වල වුවත් මේ කාල සීමාව තුළ වර්තමාන ලේකම්තුමාගේ නායකත්වයෙන් නිලධාරි මණ්ඩලය බොහෝම සුහදසීලීව කටයුතු කළා. ලේකම්තුමාට සහ ඒ හා සම්බන්ධව කටයුතු කළ නිලධාරි මණ්ඩලයටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.ඉදිරි මැතිවරණයේ දි මේ සභාවේ මන්ත්‍රීවරු වැඩි පිරිසක් නැවත දක්නට ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.සීතා රංජනි මැතිනිය**

ගරු සභාපතිතුමනි, ගරු සභාපතිතුමා සහ ගරු මන්ත්‍රීතුමන්ලා සමඟ සහයෝගයෙන් වැඩ කළා ගොඩක් ස්තුතියි.ගරු ලේකම්තුමා අති විශිෂ්ඨයි.ඒ වගේම නිලධාරිනුත් ගොඩක් හොඳයි.අපි නිලධාරින් සමග සහයෝගයෙන් වැඩ කළා මම ගොඩක් සතුටු වෙනවා මේවගේ නිලධාරි කණ්ඩායමක් එක්ක වැඩ කර ගැනිමට හැකි වීම පිළිබඳව .ඔයාලා හැමදෙනාටම ඉදිරි අනාගතය සුභ වෙන්න කියලා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2006 ඉදන් මම මේ සභාවේ කටයුතු කළා. මත්තමගොඩ ප්‍රදේශය පිළිබඳ සොය බලා කටයුතු සිදු කළ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම් තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.කුණු ට්‍රැක්ටරයක් ලබා දුන්නා,හතමුනේවත්ත ඉඩම් වෙන්කරලා වැට ගහලා දුන්නා වීථි පහන් සවි කරලා දුන්නා ශ්‍රමදාන කටයුතු සහ ජංගම සේවා කටයුතු සිද්ධ කළා මේ සෑම දෙයක්ම ඉටු කර දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සභාපතිතුමා,ලේකම්තුමාට ගල්පාත ජනතාව වෙනුවෙන් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.ගරු මන්ත්‍රීතුමන්ලාටත් කාර්යය මණ්ඩලයටත් මේ දක්වා සහයෝගයෙන් සුහදශිලීව වැඩ කටයුතු කිරිම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අපි හිටපු වසර 05 තුළ ගරු සභාපතිතුමා ,මන්ත්‍රීතුමන්ලා ,ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කැප වෙමින් සේවය කිරිම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.ලේකම්තුමා හොඳ නායකත්වයක් ලබා දුන්නා මෙම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න ඒ සඳහා තව දුරටත් ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මෙම සභාවේ ඉදිරි ගමන සාර්ථක වෙන්න කියාත් මා ප්‍රාර්ථනා කරනවා.

***සභාපතිතුමාගේ ස්තුති කථාව**

ගරු මන්ත්‍රීතුමනි,ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය ප්‍රාදේශීය සභාව සාර්ථක කර ගැනීමට ලබා දුන් සහයෝගය විශේෂයෙන්ම අගය කරන්න ඕන.මම වසර 13 ක් මේ සභාවේ මන්ත්‍රී වෙලා උප සභාපතිවෙලා සභාපති වෙලා හිටියා නමුත් මම මේ සෑම මන්ත්‍රීකෙනෙකුටම එක හා සමානව සැළකුවා.මේ වසර 5 තුළ කාර්යය මණ්ඩලයත් මන්ත්‍රීතුමන්ලාත් එකතුවෙලා විශාල කාර්යය භාර්යයක් ඉටු කළා. උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වසර 05 තුළම අයවැය සම්මත කිරිමට ගැටළුවකින් තොරව කටයුතු සිදු කිරිම සම්බන්ධයෙන් මගේ ගෞරවය ප්‍රනාමය පුද කර සිටිනවා.ගරු ලේකම්තුමා සම්බන්ධවෙලා මේ වෙනකන් කාර්යය මණ්ඩලයත් සමඟ නීත්‍යානුකුලව හොඳට වැඩ කටයුතු සිදු කළා.ඒ පිළිබඳව මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් සුහම සුභ අනාගතයක් කියලා ප්‍රාර්ථනා කරනවා.

අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්යය මණ්ඩලයටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් ප.ව 2.12.30 ට පමණ මහ සභා රැස්වීම අවසන් කරන ලදි

**(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 05. යටියන්තොට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම්,ඉඩම් අනු බෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරිම අනුමත කිරිම පිළිබඳ මෙම ආයතනය හා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව සුදුසු සංශෝධනවලට යටත්ව යටියන්තොට බල ප්‍රදේශයේ අදාල ප්‍රදේශවලට වලට බලාත්මක කිරිම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමාගේ යෝජනාව

(ඉ) 06. යටියන්තොට ප්‍රාදේශීය සභාව තුළ දන්ත සායනයක් පැවැත්වීම අවශ්‍ය පහසුකම් ආරම්භ කිරිමට සහ ඒ සඳහා වන අවශ්‍ය කටයුතු ප්‍රාදේශීය සභාව වෙතින් සලසා දීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාව

(ඉ) 07. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතුව ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුලත් දේපල ස්ථාන සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් වටිනාකම් තක්සේරුවක් අයදුම්කර ඒ වෙනුවෙන් දේපල ස්ථාන 15 සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අංක CV/PCA/YPS/KE/01,02,05,07,08,10,11,18,19,20 දරන 2023.02.27 දිනැති තක්සේරු වාර්තාව අනුව එම දේපල වල තක්සේරු වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනවල හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරිම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාව

(ඉ) 08. යටියන්තොට ප්‍රාදේශිය සභාවේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩුව පවතින සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා දෙදෙනෙකු සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය බව එම තනතුරට අදාලව දෛනිකව රැස්වන වැඩ සැළකිල්ලට ගැනිමේ දී හදුනාගෙන ඇත.ඒ සඳහා අංක 212,ගොමාඩුව යටියන්තොට පදිංචි ඒ.එච්.නිශාන් සමිත් රත්නසිරි යන අය ( ජා.හැ.932522071V) හා අංක 55 මහවිල,නවගම්මානය,යටියන්තොට පදිංචි මාලින්ද සමන්සිරි දසනායක යන අය ( ජා.හා.883343000V) සුදුසු බව හා එම අය එම තනතුරේ රාජකාරි සඳහා කැමති බව දන්වා ඇති බැවින් වර්ෂයක කාලයක් සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ගැනීමටත්,රාජ්‍ය පරිපාලන චක්‍රලේක 3/2016 යටතේ වන දෛනිකව දීමනාව ගෙවිම් කිරිමටත් ,නොදිරන කසල විධිමත් කිරිම සඳහා රාජකාරි පැවරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාව

(ඉ) 09. අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් රුවන්වැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ නඩු අංක 83679 (ඩබ්.ජ් සරත් ගුණතිලක මයා,අංක 108 ,ගිනිගත්හේන පාර ,යටියන්තොට) තීන්දුවට එරෙහිව කොළඹ අභියාචනාධිකරණය ඉදිරියේ ගොනුකර තිබූ අභියාචනා පෙත්සම සඳහා සරත් ගුණතිලක මහතා 2023.02.15 දින නඩුවට ඉදිරිපත්වී කරුණු ඉදිරිපත් කර සමථයට පත්වූ බවත් එම නිසා, එදින ගරු අධිකරණය වෙතින් අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට අවසර දෙන ලද බවත්, එහෙයින් නඩු වාර්තාව ඉදිරිපත් කරන තෙක් නඩු කටයුත්තට අදාලව ඉදිරි කටයුතු සඳහා සභාවේ අදහස් හා සුදුසු තීරණයක් ලබා දෙන ලෙසත් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාව

(ඉ) 10. යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වින්සන්ට් පෙරේරා මහජන ක්‍රීඩාංගනයේ එක් කාර්යයක් සඳහා දින 03 කට වඩා වැඩි කාලයක් කුලියට ලබා දීමේ දී දෙපාර්ශවය අතර කටයුතු විධිමත් කර ගැනිම හා අලාභ ප්‍රතිපූර්ණය විධිමත් කර ගැනිම සහ කුලී ගැනුම්කරුවන් සමඟ එළඹීමට යෝජිත සකස් කර ඇති ගිවිසුම් පත්‍රයට ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමාගේ යෝජනාව

(ඉ) 11. යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනනය වන සායනික අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරිම තුළින් මහජනතාවට මතු වන සෞඛ්‍ය ගැටළු මෙන්ම පාරිසරික ගැටළු අවම කර ගැනිම සඳහා රසායනාගාර හා වෛද්‍ය මධ්‍යස්ථාන සමග ඇති කර ගැනිමට අපේක්ෂිත ගිවිසුම මහ සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාව

(ඉ) 12. මෙම ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂයේ සිට සකස් කරන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල සේවක ණය අයවිය යුතු ශේෂය සහ සේවක ණය ගිණුමේ අයවිය යුතු ශේෂය අතර රු.672,408.87ක නොගැළපීමක් පවතී. මෙම නොගැළපීම කුමන වර්ෂයේ සිට ජනනය වී ඇත්දැයි නිශ්චිතව හඳුනාගැනීමට නොහැකි වේ. ඊට හේතුව වන්නේ 2002 වර්ෂයෙන් පසු 2017 වර්ෂය දක්වා අයවිය යුතු සේවක ණය ශේෂය තහවුරු කිරීමට වාර්ෂික උපලේඛනයක් සකස්කර ඉදිරිපත් නොවීමයි. 2017 වර්ෂයෙන් පසු උපලේඛනයක් සකස් වුවද හඳුනාගත් ඉහත නොගැළපීම නිරවුල් කරගැනීමට නොහැකි වී තිබිණ. මෙම නොගැළපීම නිරවුල් කිරීම සඳහා දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු මඟපෙන්වීම් අනුව අදාළ ලේඛන අධ්‍යනය කරන ලදී. නමුත් මෙම ලේඛනවල පවතින අපහැදිලිතා, දුර්වර්ණ වීම්, තුලනය නොවීම් හා ඒ ඒ ලේඛන අතර සුදුසු යොමු සටහන් නොවීම නිසා නිරවුල් කිරීමට අදාළ තොරතුරු හඳුනාගැනීම අපහසු කාර්යයකි. 2002 සිට 2017 දක්වාම සේවක ණය උපලේඛන සකස් නොවීමට හා උපලේඛන නොගැළපීම නිරවුල් කරගැනීමට දීර්ඝ කාලයක සිට නොහැකි වීමට මෙම අපැහැදිලිතා හේතුවී ඇති බව හඳුනාගැනීමට හැකි විය. නමුත් 2011 වර්ෂය හා 2014 සිට 2017 වර්ෂය දක්වා ලේඛන සහ එම වර්ෂවල මූල්‍ය ප්‍රකාශන එකිනෙක ගැළපීමේදී රු. 611,520.85ක සේවක ණය අයවීම් වටිනාකමක් තැන්පත් හා අත්තිකාරම් ලෙස ගිණුම් තැබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දෝෂයක් හඳුනාගැනීමට හැකි විය.

නමුත් 2002 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අදාළ ලේඛනවල පවතින ගැටලු සහගත තත්ත්වයන් හා විශේෂයෙන්ම 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා පවතින හඳුනාගත නොහැකි අපැහැදිලි ලේඛන හා ගොනු තොරතුරු නිසා තවදුරටත් පවතින රු. 60,888.02ක වටිනාකම හඳුනාගෙන, නිරවුල් කිරීමට නොහැකි වී ඇත. නමුත් ඉහත නිරවුල් කිරීමට අදාළ හඳුනාගැනීම් හා සමානව, මෙම රු.60,888.02 වටිනාකම ද ගිණුම් තැබීමේ දෝෂ නිසා ඇතිවූ නොගැළපීම් බවට උපකල්පනය කළ හැක. විශේෂයෙන්ම 2018 වර්ෂයේ සිට සේවක ණය වාර්ෂික ගැළපීම් සියල්ල, සේවක ණය ගිණුම හා වාර්ෂික ගිණුම් ප්‍රකාශ සමග එකිනෙක ගැළපෙන පරිදි යාවත්කාලීනව නඩත්තු වේ. තවදුරටත් නිරවුල් කරගැනීමට නොහැකි මෙම රු. 60,888.02ක් වටිනාකම ලේඛන තුළ හඳුනාගැනීම් මත නිරවුල් කිරීමට වෙහෙසවීම නිෂ්ප්‍රයෝජන හා අකාර්යක්ෂම ආයතනික යෙදවීමක් විය හැකි බව දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටුවේ ද මගපෙන්වීම වේ.

ඒ අනුව නිශ්චිතව හඳුනාගෙන ඇති රු. 611,520.85ක දෝෂ සහිත ගිණුම් තැබීම ගිණුම් ප්‍රකාශන තුළ සභා අනුමැතියෙන් නිවැරදි කිරීමටත්, තවදුරටත් ශේෂවන, ලැබිය යුතු වටිනාකමක් ලෙස ගිණුම්ගතව ඇති රු. 60,888.02ක නොගැළපීම් වටිනාකම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය අනුව ගරු අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව අත්හැරීම සඳහාත් ගරු මහා සභා අනුමැතිය ලබාගැනීමට ගරු සභාපතිතුමාගේ යෝජනාව

(ඉ) 13. මත්තමගොඩ හතමුණේවත්ත ඉඩමේ සීමා මායිම් වෙන් කර කම්බි වැට සකස් කිරීමට යටියන්තොට ඒ.බී.සී කොන්ක්‍රීට් ආයතනයෙන් මිලදී ගත් රු 27,000.00 ක් වටිනා කොන්ක්‍රීට් කණු 30 සඳහා ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපතිතුමාගේ

(ඉ) 14. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු බලවත්තොට ඕව්ටේවත්ත ඉඩම බදු දීමේ ගිවිසුම හා සතිපොළ ගබඩා කාමරය බදු දිමේ ගිවිසුම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාව

**(ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**

01 2023 පෙබරවාරි මාසයට අදාල වියදම් වාර්තාව

02. 2023 පෙබරවාරි මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව
03. 2023පෙබරවාරි මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව
04. 2023 පෙබරවාරි මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව

(ඌ) වෙනත් කරුණු

**01.නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිම**

**02.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම**

***සභාපතිතුමාගේ ස්තූති කථාව**